# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date – 2025.01.02 පැය 0545 | දුරකථන අංකය Tel.NO – 011-2887973 | මගේ අංකය My NO – D/Media/Out/ 07/2025 | විද්‍යුත් ලිපිනය E-Mails – dir.media@police.gov.lk |


**01.** **මාතර බන්ධනාගාරයේ ගොඩනැගිලල්ලක් මතට ගසක අත්තක් කඩා වැටීම හේතුවෙන් රැඳවියකු මියගොස් තවත් රැඳවියන් පිරිසක් තුවාල ලැබීම. - මාතර පොලිස් වසම.**

2025.01.01 වන දින රාත්‍රී කාලයේදී මාතර පොලිස් වසමේ මාතර බන්ධනාගාරයේ ගොඩනැඟිල්ලක් මතට ගසක අත්තක් කඩා වැටීම හේතුවෙන් රැඳවියන් පිරිසක් තුවාල ලබා මාතර රොහලට අතුලත් කර ඇති බවට මාතර පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

රැඳවියන් රඳවා සිටි ගොඩනැගිල්ල ආසන්නයේ පිහිටි බෝ ගසක අත්තක් කඩා වැටීම හේතුවෙන් ගොඩනැගිල්ලේ රඳවා සිටි රැඳවියන් 12 දෙනෙකු තුවාල ලබා මාතර රෝහලට ඇතුළත් කර ඇති අතර ඉන් එක් රැඳවියෙකු ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ තුර්කි ගම්මාන,මිදිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සිදුවිම සම්බන්දව මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02.** **විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - නාරම්මල පොලිස් වසම.**

2025.01.01 වන දින සවස් කාලයේදී නාරම්මල පොලිස් වසමේ රණාවත්ත ප්‍රදේශයේ පදිංචි තරුණයකු අතුරුදන්ව ඇති බවට නාරම්මල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත. පොලිසිය හා ප්‍රදේශවාසීන් එක්ව අතුරුදහන්වී ඇති පුද්ගලයා සොයා ප්‍රදේශයේ සිදුකළ සෝදිසියකදී රණාවත්ත වෙල් යායක තිබී අතුරුදහන් වූ පුද්ගලයාගේ මළ සිරුර හමුවී ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ රණාවත්ත, නාරම්මල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු අනවසර විදුලි රැහැනක ගැටී විදුලි සැර වැදීමෙන් මියගොස් ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර අනවසර විදුලි රැහැන් අදින ලද සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා නාරම්මල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාදම්පිටිය පොලිස් ස්ථානය.

2025.01.01 වන දින සවස් කාලයේදී මාදම්පිටිය පොලිස් වසමේ රන්දිය උයන මහල් නිවාසය සංකීර්ණය ආසන්නයේදී මාදම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාදම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2025.01.01 වන දින රාත්‍රී කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ ගල්කිස්ස අධිකරණය ආසන්නයේදී ගල්කිස්ස පොලිස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අනුරාධපුර පොලිස් ස්ථානය.

2025.01.01 වන දින සවස් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර නගරයේ දී අනුරාධපුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකටයුතු යතුරු පැදියක් නවතා පරීක්ෂා කිරීමේදී එහි පැදිකරු සන්තකයේ තිබී **හෙරොයින් ග්‍රෑම් 30 ක් සොයාගෙන ඇති අතර හෙරොයින් සන්තකයේ තබා ගෙන ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් යතුරු පැදිය** ද සමඟ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පිටකොටුව පොලිස් ස්ථානය.

2025.01.01 වන දින උදෑසන කාලයේදී පිටකොටුව පොලිස් වසමේදී පිටකොටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මත් කරල් 20448** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පිටකොටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානය.

2025.01.01 වන දින දහවල් කාලයේ ඌරගස්මංහන්දිය පොලිස් වසමේ නවදගල ප්‍රදේශයේදී ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 910 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන නුගේතිබ්බකන්ද, නවදගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඌරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - හලාවත පොලිස් වසම.

2025.01.01 වන දින සවස් කාලයේ හලාවත පොලිස් වසමේ හලාවත ඉරණවිල මාර්ගයේ වැලිහේන ප්‍රදේශයේදී ඉරණවිල දෙස සිට හලාවත දෙසට ධාවනය වූ වෑන් රථයක් එම දිසාවට ධාවනය වූ යතුරුපැදියක පසුපසින් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හලාවත රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ හලාවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සිදුකළ වෑන් රථයේ රියදුරු ලෙස අවුරුදු 15 ක බාලවයස්කරුවෙකු කටයුතු කර ඇති අතර සැකකරු හලාවත පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. බාලවයස්කරුවෙකුහට රියපැදවිමට රිය ලබාදිම සම්බන්දව වෑන්රථයේ හිමිකාරියටද නිතීමය පියවර ගැන්මට කටයුතු කිරිමට පොලිසිය කටයුතු කරනු ලබන අතර අනතුර සම්බන්ධයෙන් හලාවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - පිංදෙනිය පොලිස් වසම.

2025.01.01 වන දින සවස් කාලයේ පිංදෙනිය පොලිස් වසමේ කෑගල්ල අවිස්සාවේල්ල මාර්ගයේ කිලෝමීටර් 12 කණුව ආසන්නයේදී කෑගල්ල දෙස සිට අවිස්සාවේල්ල දෙසට ධාවනය වූ වෑන් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ත්‍රී රෝද රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රී රෝද රථ රියදුරු හා එහි ගමන් කළ කාන්තාවන් දෙදෙනෙකු තොරණගහපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී එක් කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 52 ක් වූ අටාල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු හා අනෙක් මගී කාන්තාව වැඩිදුර ප්‍රතිකාර සඳහා කෑගල්ල රෝහල ඇතුළත් කර ඇති අතර පිංදෙනිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - හොරණ පොලිස් වසම.

2025.01.01 වන දින සවස් කාලයේ හොරණ පොලිස් වසමේ හොරණ කොළඹ මාර්ගයේ පොකුණුවිට ප්‍රදේශයේදී පොකුණුවිට දෙස සිටකොළඹ දෙසට ධාවනය වූ කාර් රථයක මාර්ගය හරහා ගමන් කළ පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා හොරණ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 79 ක් වූ වැලිගම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරු බීමත්ව සිට ඇත.හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - හබරණ පොලිස් වසම.

2025.01.01 වන දින උදෑසන කාලයේ හබරණ පොලිස් වසමේ හතරැස්කොටුව මින්නේරිය මාර්ගයේ කිලෝමීටර් කාංගි වංගුව ආසන්නයේදී හතරැස්කොටුව දෙස සිට මින්නේරිය දෙසට ධාවනය වූ කාර් රථයක රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ත්‍රී රෝද රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රී රෝද රථ රියදුරු පොළොන්නරුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ ගල්ඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - මහියංගනය පොලිස් වසම.

2025.01.01 වන දින රාත්‍රී කාලයේ මහියංගනය පොලිස් වසමේ මහියංගනය ලොග්ගල්ඔය මාර්ගයේ රෝහණ හන්දිය ප්‍රදේශයේදී මහියංගනය දෙස සිට මාපාකඩවැව දෙසට ධාවනය වූ යතුරු පැදියක මාර්ගය හරහා ගමන් කළ පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පදිකයා මහියංගනය රෝහලට ඇතුලත් කිරීමේදී යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ මහියංගනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පදිකයා මහියංගනය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන අතර මහියංගනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**